# මහානාම විද්‍යාලය - කොළඹ 03

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2023

## 12 - ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය (2022 මැයි)

# රසායන විද්‍යාව - I

**කාලය - පැය 01යි**

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) පහත සඳහන් කුමන වායු යුගලයේ සමාන අණු සංඛ්‍යා ඇත් ද? (H=1, O = 16, N = 14, C = 12, Cl = 35.5)

(i) $N_2O \rightarrow 44g$ සහ $NH_2OH \rightarrow 66g$

(ii) $CO_2 \rightarrow 8.8g$ සහ $Cl_2 \rightarrow 0.71g$

(iii) $NH_2OH \rightarrow 33g$ සහ $CO_2 \rightarrow 22g$

(iv) $N_2O \rightarrow 44g$ සහ $NH_2OH \rightarrow 33g$

(v) $Cl_2 \rightarrow 35.5g$ සහ $CO_2 \rightarrow 44g$

(2) $Ca_{10}(PO_4)_6F_2$ (එප්පාවල ෆොස්ෆේට්) හි සූත්‍රය වේ. ජලය පිරිසිදු කිරීමට භාවිතා කරන පොටෑශ්ඇලම් හි සූත්‍රය $KAl(SO_4)_2 12H_2O$ වේ. මෙම සංයෝග දෙකෙහි ඔක්සිජන් හි ස්කන්ධ ප්‍රතිශත පිළිවෙලින්,
(Ca=40, P=31, F=19, K=39, Al=27, S=32, O=16, H=1)

(i) 83.09% හා 76%

(ii) 38.09% හා 67%

(iii) 3.809% හා 63.5%

(iv) 40.02% හා 76%

(v) 34.5% හා 63.2%

(3) ග්ලූකෝස් විවිධ බීම වර්ග පැණිරස කිරීම සඳහා යොදාගනු ලැබේ. මෙහි අණුක සූත්‍රය පහත ආකාරයට ලිවිය හැකිය.

```
CHO
|
CHOH
|
CHOH
|
CHOH
|
CHOH
|
CH2OH
```

එක්තරා අඹ බීමක ග්ලූකෝස් 15% ක් බර අනුව අඩංගු වේ. මෙම බීම වීදුරුවක පරිමාව 160ml වන අතර බීම වල ඝනත්වය $1.25gcm^{-3}$ වේ. අඹ බීම වීදුරු දෙකක අඩංගු ග්ලූකෝස් අණු ගණන කොපමණද?
(O = 16 , H = 1 , C = 12)

(i) $1.5055 \times 10^{23}$

(ii) $42.154 \times 10^{23}$

(iii) $2.007 \times 10^{23}$

(iv) $1.2044 \times 10^{23}$

(v) $36.1332 \times 10^{23}$

(4) KCl $x_1$g ද $CaCl_2$ $x_2$g ද ජලයේ ද්‍රාවණය කර 1.00$dm^3$ දක්වා තනුක කරන ලදී. මෙම ද්‍රාවණයේ 25.00$dm^3$ක් $Pb(NO_3)_2$ ද්‍රාවණ වැඩිපුර ප්‍රමාණයක් සමඟ පිරියම් කරන ලදී. ලැබුණු $PbCl_2$ අවක්ෂේපයේ ස්කන්ධය $x_3$g විය. (සාපේක්ෂ අණුක ස්කන්ධය $KCl = M_1$, $CaCl_2 = M_2$, $PbCl_2 = M_3$)
පහත දැක්වෙන කුමන ප්‍රකාශය සත්‍ය වේද?

(i) $X_3 = \left[\frac{X_1}{M_1} + \frac{2X_2}{M_2}\right] \times M_3$

(ii) $X_3 = \frac{25}{1000} \times \left[\frac{X_1}{2M_1} + \frac{X_2}{M_2}\right] \times M_3$

(iii) $X_3 = \frac{1}{1000} \times \left[\frac{X_1}{M_1} + \frac{X_2}{2M_2}\right] \times M_3$

(iv) $X_3 = \frac{25}{1000} \times \left[\frac{X_1}{M_1} + \frac{2X_2}{M_2}\right] \times M_3$

(v) $X_3 = \frac{X_1}{2M_1} + \frac{X_2}{M_2} \times \frac{25}{1000}$

(5) අයනික අරය ආරෝහණය වන නිවැරදි අනුපිළිවෙල වනුයේ,

(i) $Be^{2+} < Na^{+} < N^{3-} < As^{3-} < Se^{2-} < K^{+}$

(ii) $Be^{2+} < Na^{+} < N^{3-} < K^{+} < As^{3-} < Se^{2-}$

(iii) $Be^{2+} < Na^{+} < N^{3-} < K^{+} < Se^{2-} < As^{3-}$

(iv) $Be^{2+} < N^{3-} < K^{+} < Na^{+} < Se^{2-} < As^{3-}$

(v) $N^{3-} < Be^{2+} < Na^{+} < K^{+} < As^{3-} < Se^{2-}$

(6) 10.4 ppm $Cr^{3+}$ ද්‍රාවණයක් 1$dm^3$ $K_2SO_4.Cr_2(SO_4)_3.24H_2O$ දියකර සාදා ඇත. මෙම ද්‍රාවණයේ $SO_4^{2-}$ සාන්ද්‍රණය ($mol\,dm^{-3}$) සොයන්න. (Cr = 52) (1ppm = 1$mg\,dm^{-3}$)

(i) $0.2 \times 10^{-3}$

(ii) $0.4 \times 10^{-3}$

(iii) $0.1 \times 10^{-3}$

(iv) $0.8 \times 10^{-3}$

(v) $5.2 \times 10^{-4}$

(7) කැතෝඩ කිරණවල ලක්ෂණයක් නොවන්නේ,

(i) තුනී ලෝහ පත්‍ර හරහා ගමන් කරයි.

(ii) වස්තුවක ගැටුණු විට තාපය උත්පාදනය වේ.

(iii) ආලෝකයේ වේගයෙන් සරල රේඛීයව ගමන් කරයි.

(iv) වායු අයනීකරණ කිරීමේ හැකියාවක් ඇත

(v) ලෝහ පත්‍රයක ඉලක්කයට පතිත වූ විට X කිරණ නිපදවා ගත හැක.

CS CamScanner

(8) හයිඩ්‍රජන්වල පරමාණුක වර්ණාවලියේ ලයිමාන් ශ්‍රේණියේ පිහිටීම නිවැරදිව නිරූපණය කරන්නේ මින් කුමන රූප සටහන් මගින්ද?

(i)



(ii)



(iii)



(iv)



(v)



(9) $KNO_3$ සහ $AgNO_3$ පමණක් දිය වී ඇති ජලීය ද්‍රාවණයක $1dm^3$ ක පරිමාවක් සලකන්න. මෙම ද්‍රාවණය තුළ $KNO_3$ සහ $AgNO_3$ හි සාන්ද්‍රණයන් පිළිවෙලින් $0.3moldm^{-3}$ සහ $0.2moldm^{-3}$ වේ. මෙම ද්‍රාවණයෙන් $0.5dm^3$ ක් වෙන්කර ගත්විට එය තුළ ඇති $KNO_3$ සහ $AgNO_3$ හි සාන්ද්‍රණයන් හා මවුල ප්‍රමාණයන් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

| පිළිතුරු | $KNO_3$ සාන්ද්‍රණය $moldm^{-3}$ | $AgNO_3$ සාන්ද්‍රණය $moldm^{-3}$ | $KNO_3$ මවුල ප්‍රමාණය | $AgNO_3$ මවුල ප්‍රමාණය |
|---|---|---|---|---|
| (i) | 0.15 | 0.10 | 0.3 | 0.2 |
| (ii) | 0.15 | 0.10 | 0.15 | 0.1 |
| (iii) | 0.30 | 0.20 | 0.3 | 0.2 |
| (iv) | 0.30 | 0.20 | 0.15 | 0.1 |
| (v) | 0.35 | 0.20 | 0.15 | 0.3 |

(10) කැල්සියම් කාබනේට් ($CaCO_3$) සහ මැග්නීසියම් කාබනේට් ($MgCO_3$) හි සම මවුලික මිශ්‍රණයකින් ග්‍රෑම් M ප්‍රමාණයක් තවදුරටත් ස්කන්ධයේ අඩුවීමක් නොවන තුරු රත්කල විට පිට වූ $CO_2$ වායුව ප්‍රමාණය මවුල 0.4 ක් බව සොයාගන්නා ලදී. M හි අගය සොයන්න

(Ca=40, O=16, Mg=24, C=12)

(i) 36.8g
(ii) 27.3g
(iii) 63.6g
(iv) 40.4g
(v) 52.2g

(11) $XCa_3(PO_4)_2 + YSiO_2 + ZC \longrightarrow WCaSiO_3 + QCO + RP_4$ යන සමීකරණය තුලිත කර X, Y, Z, W, Q, R අගයන් සොයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| X → | 2 | 7 | 2 | 5 | 6 |
| Y → | 3 | 6 | 6 | 10 | 9 |
| Z → | 5 | 5 | 10 | 1 | 7 |
| W → | 6 | 9 | 6 | 4 | 10 |
| Q → | 5 | 3 | 10 | 3 | 8 |
| R → | 4 | 2 | 1 | 2 | 1 |
| පිළිතුරු → | (i) | (ii) | (iii) | (iv) | (v) |

(12) පහත දැක්වෙන කුමන ප්‍රකාශය අසත්‍යද?

(i) N වල ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය + වේ.

(ii) බහු ඉලෙක්ට්‍රෝන පරමාණුවක ඵලදායී න්‍යෂ්ටික ආරෝපණය මගින් එක් එක් ඉලෙක්ට්‍රෝනයකට දැනෙන ආවරණය පැහැදිලි කරයි.

(iii) ඉලෙක්ට්‍රෝන පිටකිරීමෙන් අයනයක් සෑදීමේදී කාක්ෂික අතර පරතරය උදාසීන පරමාණුවකට වඩා කුඩා වේ.

(iv) බැමුම් සමාන්තර ඉලෙක්ට්‍රෝන දෙකක් එකම කාක්ෂිකක යුගල් විය හැක.

(v) එක ඉලෙක්ට්‍රෝනයක සුර්ණය අනෙක් ඉලෙක්ට්‍රෝනයේ සුර්ණය මගින් මැඩපවත්වා ගත හැකි නම් කාක්ෂිකවල යුග්ම වේ

(13) හයිඩ්‍රජන් පරමාණුවක වර්ණාවලිය සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,

(i) ලයිමාන් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර තරංග ආයාමය වෙනස බාමර් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර තරංග ආයාම වෙනසට වඩා අඩු වේ.

(ii) බාමර් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර තරංග ආයාමය වෙනස පාෂන් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර තරංග ආයාමයට වඩා වැඩිය

(iii) බාමර් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර ශක්ති වෙනස ලයිමාන් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර ශක්ති වෙනසට වඩා අඩු වේ.

(iv) බාමර් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර ශක්ති වෙනස ලයිමාන් ශ්‍රේණියේ දෙවන හා තෙවන රේඛා අතර ශක්ති වෙනසට සමාන වේ.

(v) බාමර් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර සංඛ්‍යාත වෙනස ලයිමාන් ශ්‍රේණියේ පළමු රේඛා දෙක අතර සංඛ්‍යාත වෙනසට වඩා අඩු වේ

(14) ධන කිරණ සම්බන්ධව අසත්‍ය වන්නේ,

(i) e/m අගය වායුව මත රඳා පවතී

(ii) විද්‍යුත් ක්ෂේත්‍රයකදී අපගමනය වේ

(iii) චුම්බක ක්ෂේත්‍ර මගින් අපගමනය වේ.

(iv) අපගමන කෝණය න්‍යෂ්ටි ප්‍රකිරණ සීඝ්‍රතාවය මත තීරණය වේ.

(v) ගම්‍යතාවයක් ඇති අංශුවලින් සමන්විත වේ.

(15) $O^2$ අයනයේ න්‍යෂ්ටියක ආරෝපණය වන්නේ,

(i) $\frac{+8 \times 96500\ C}{6.022 \times 10^{23}}$

(ii) -2 C

(iii) $\frac{-2 \times 96500\ C}{6.022 \times 10^{23}}$

(iv) -2 x 96500 C

(v) +8 x 96500 x -2 C

**16 සිට 20 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත උපදෙස් කොටුව අනුගමනය කරන්න.**

| (i) | (ii) | (iii) | (iv) | (v) |
|---|---|---|---|---|
| a සහ b පමණක් නිවැරදිය | b සහ c පමණක් නිවැරදිය | c සහ d පමණක් නිවැරදිය | a සහ d පමණක් නිවැරදිය | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් නිවැරදි වේ. |

CamScanner

a. මෙහි $SO_3^{2-}$ නිසා පිටවන ඉලෙක්ට්‍රෝන මවුල ගණන $25 \times 10^{-3}$ mol වේ.

b. ප්‍රතික්‍රියාවට $IO_3^-$ මවුල $\frac{5}{2}$ ක් සහභාගී වේ.

c. $KIO_3$ මවුල ගණන $25 \times 10$ වේ

d. $IO_3^-$, $I_2$ බවට පත්වීමට ඉලෙක්ට්‍රෝන මවුල 5 ක් වැය වේ.

**21 - 25 දක්වා දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත උපදෙස් කොටුව අනුගමනය කරන්න.**

| පිළිතුරු | පළමු වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| i | සත්‍යය | සත්‍ය වන අතර පළමු වගන්තිය නිවැරදිව පහදා දෙයි |
| ii | සත්‍යය | සත්‍ය වන අතර පළමු වගන්තිය නිවැරදිව පහදා නොදෙයි |
| iii | සත්‍යය | අසත්‍යය |
| iv | අසත්‍යය | සත්‍යය |
| v | අසත්‍යය | අසත්‍යය |

| | පළමු වගන්තිය | දෙවන වගන්තිය |
|---|---|---|
| (21) | $Ba(OH)_2(aq)$ සහ $H_3PO_4$ අතර ප්‍රතික්‍රියාවෙන් $Ba_3(PO_4)_2$ හා $H_2O$ සෑදේ | $0.2 moldm^{-3}$ $Ba(OH)_2(aq)$ $400.0 cm^3$ සහ $0.4 moldm^{-3}$ $H_3PO_4(aq)$ $100.0 cm^3$ මිශ්‍ර කලවිට ලැබෙන $Ba_3(PO_4)_2$ මවුල ගණන $2 \times 10^{-2}$ වේ. |
| (22) | $0.1 moldm^{-3}$ $H_2SO_4$ ද්‍රාවණයකින් යම් පරිමාවක් හා $0.2 moldm^{-3}$ NaOH ද්‍රාවණයකින් ඊට සමාන පරිමාවක් මිශ්‍ර කලවිට මිශ්‍රණයේ අඩංගු අයන මවුල ප්‍රමාණය 0.75 වෙයි. මෙහිදී භාවිතාකළ පරිමාව වනුයේ $2.5 dm^3$ | $H_2SO_4$ හා NaOH අතර ප්‍රතික්‍රියාවේදී NaOH ඔක්සිහරණය වේ. |
| (23) | නිවාරක ආවරණය අඩු වී සඵල න්‍යෂ්ටික ආකර්ෂණය වැඩිවන විට කැටායනික අරය අඩු වේ. | කැටායනික අරය ලෙස මනින්නේ මූලද්‍රව්‍යය පරමාණුවක න්‍යෂ්ටියේ සිට ඉලෙක්ට්‍රෝන අඩංගු බාහිර ශක්ති මට්ටමට ඇති ලම්බ දුරයි. |
| (24) | මූලද්‍රව්‍යයක රසායනික ගුණ එහි ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය මත රඳා පවතී. | මූලද්‍රව්‍යයක රසායනික ගුණ පරමාණුක ස්කන්ධයේ ශ්‍රිතයක් වේ. |
| (25) | පරමාණු විද්‍යුත් වශයෙන් උදාසීන අවස්ථා නැත්තේම නොවේ. | විද්‍යුත් උදාසීනතාවයට උපපරමාණුක අංශුවල නියුට්‍රෝන, මීසෝන, මියෝන වැනි උපපරමාණුක අංශුද දායක වේ. |

CamScanner